# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012

2015 මාර්තු - මැයි

### සමාජීය විද්‍යා පීඨය

### පුරාවිද්‍යාව - ARCH E2025

### අභිලේඛන හා නාණක විද්‍යාව

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න <u>පහකට (05)</u> පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

**<u>1 කොටස</u>**

01. ශිලාලේඛන යනු මොනවාදැයි හඳුන්වාදී ඉන් පුරාවිද්‍යාවට ලැබෙන දායකත්වය කවරේදැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

02. **<u>එක්කෝ</u>**
අභිලේඛනවලින් හෙළිවන අතීත ශ්‍රී ලංකාවේ ආර්ථික හා ආගමික පසුබිම පිළිබඳව නිදසුන් සහිතව විස්තර කරන්න.

**<u>නැතහොත්</u>**
ශිලා ලේඛනවල දක්වෙන බ්‍රාහ්මී නොවන සංකේත පිළිබඳව තොරතුරු දක්වන්න.

03. "ශ්‍රී ලංකාවේ අක්ෂර කලාවේ සමාරම්භය මහින්දාගමනයට පෙර සිදුවිය." මෙම කියමනෙහි සත්‍ය අසත්‍යතාවය පිළිබඳව විමර්ශනය කරන්න.

04. **<u>එක්කෝ</u>**
දකුණේ ශිලා ලේඛනවලින් හෙළිවන ක්ෂත්‍රීය පරම්පරා පිළිබඳව විමසන්න.

**<u>නැතහොත්</u>**
බ්‍රාහ්මී අක්ෂර කෙරෙහි බල පෑ සාතවාහන හා බටහිර ක්‍ෂත්‍රප ආභාසයන් පිළිබඳව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

**<u>11 කොටස</u>**

05. **<u>එක්කෝ</u>**
නාණක විද්‍යාව යනු කුමක්දැයි හඳුන්වා දී පුරාවිද්‍යා අධ්‍යයනය සඳහා ඉන් ලැබෙන දායකත්වය කෙසේදැයි විමසන්න.

**<u>නැතහොත්</u>**
නාණක විද්‍යා විෂයෙහි ආරම්භය හා විකාශනය පිළිබඳව පැහැදිලි කරන්න.

06. ලෝකයේ මුදලෙ හි ආරම්භය හා විකාශනය පිළිබඳව විමසීමක් කරන්න.

07. ශ්‍රී ලංකාවේ මුල්ම කාසිය (පුරාණ කාසිය) පිළිබඳව සවිස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කරන්න.

08. පහත සඳහන් මාතෘකා <u>තුනක් (03)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i ගජ ලක්ෂ්මී කාසිය
ii බාටර් ක්‍රමය
iii අශ්වයා සහ ස්වස්තික කාසිය
iv කුෂාණ කාසි
iv සමුද්‍ර ගුප්ත කාසි
vi දෙඅකය හා අකය කාසිය